www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ආන්ඩුව විපක්ෂ ජනාධිපති අපේක්ෂකයා අත් අඩංගුවට ගනියි

## Sri Lankan government arrests opposition presidential candidate

කේ. රත්නායක විසිනි
2010 පෙබරවාරි 9

ජනවාරි 26 වන දා පැවැත්වුනු ජනාධිපතිවරනයේ දී ප්‍රධාන විරුද්ධ පක්ෂවල පොදු අපේක්ෂකයා ලෙස තරග වැදුනු ජනරාල් සරත් ෆොන්සේකා මිලිටරි පොලීසිය විසින් 8 වන දින රාත්‍රියේ දී අත් අඩංගුවට ගනු ලැබිනි. මෙම ක්‍රියාවෙන් සලකුනු කලේ, පසු ගිය දෙසතිය පුරා ආන්ඩුව සිය දේශපාලන විරුද්ධවාදීන්ට එරෙහිව ගෙනගිය කඩාපැනීමේ ඉහල වර්ධනයක් ද මේ සතිය තුල කැඳවනු ඇතැයි අපේක්ෂිත පාර්ලිමේන්තු මැතිවරනයේදී බිය ගැන්වීම සහ මර්දනය වඩාත් පුලුල් මට්ටමක් ගනු ඇති බවට පලවන පෙර නිමිත්තක් ද වේ.

ෆොන්සේකා, ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) සෝමවංශ අමරසිංහ, ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසයේ රවුෆ් හකීම් සහ ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පෙරමුනේ මනෝ ගනේෂන් යන විරුද්ධ පක්ෂ නායකයන් සමග සිය කාර්යාලයෙහි රැස්වීමක් පවත්වමින් සිටියේය. ජනාධිපතිවරනයේ දී ෆොන්සේකා විශාල වැඩි ඡන්ද සංඛ්‍යාවකින් පරාජයට පත් කල ප්‍රතිඵලයට එරෙහිව නීතිමය අභියෝගයක් ගෙන ඒම හා මහ මැතිවරනයේ දේශපාලන මූලෝපායන් ගැන ද ඔවුහු සාකච්ඡා කරමින් සිටියහ.

ගනේෂන් සඳහන් කරන පරිදි, කාර්යාලයට ඇතුලු වූ මිලිටරි පොලිස් නිලධාරීන් දුසිම් ගනනක්, අත් අඩංගුවට ගන්නා බව ෆොන්සේකාට පවසා සිටියේය. තමන්ට විරුද්ධව පවතින චෝදනා කවරේ දැයි ප්‍රශ්න කල විශ්‍රාමික ජනරාල්වරයා, කවරාකාර හෝ අත් අඩංගුවට ගැනීමක් සිදු වන්නේ නම් එය කල යුත්තේ සිවිල් පොලීස් නිලධාරීන් විසින් යැයි අවධාරනය කලේ ය. ඔහු ප්‍රතිරෝධය පෑ විට, ෆොන්සේකා ද ඔහුගේ ලේකම් සේනක ද සිල්වා ද කුදලාගෙන යනු ලැබිනි.

"ඒ අය ඔහු අත් අඩංගුවට ගෙන බල්ලෙක් වගේ එලියට ඇද ගෙන ගියා," ගනේෂන් නිව් යෝක් ටයිම්ස් පුවත්පතට පැවසී ය. කාර්යාලය සන්නද්ධ හමුදා භටයන් විසින් වටකර තිබුනු අතර මාධ්‍යවේදීන් ගොඩනැගිල්ලට ඇතුලු වීම වලක්වන ලදී.

මැතිවරනයට තරග කිරීම සඳහා නොවැම්බරයේ දී ඉල්ලා අස් වන තෙක් ෆොන්සේකා, රටේ හමුදාපති ලෙස කටයුතු කලේය ජනාධිපති මහින්ද රාජපක්ෂට එරෙහිව කුමන්ත්‍රනයක් සැලසුම් කලේ යැයි ඉන් පසුව ආන්ඩුව ඔහුට චෝදනා එල්ල කල අතර, දෙසතියක් තිස්සේ රට තුල තියුනු වෙමින් පැවති දේශපාලන ආතතීන් හමුවේ අත් අඩංගුවට ගැනීම සිදු විය. මැතිවරනයදා, ආතති සහගත විවාදයකට මග පාදමින් සිය ගනනක් හමුදා භටයන් ෆොන්සේකා නැවතී සිටි හෝටලය වැටලීය. කුමන්ත්‍රන චෝදනා මත පොලීසිය දැනට මත් විශ්‍රාමික මිලිටරි නිලධාරීන් හා මාධ්‍යවේදීන් අත් අඩංගුවට ගෙන ඇත. ආන්ඩුව ෆොන්සේකාට සහාය දුන් ඉහල පෙලේ හමුදා සහ පොලිස් නිලධාරීන් විරේක කර ඇත.

මිලිටරි නීතිය යටතේ ෆොන්සේකා අත් අඩංගුවට ගැනීමෙන් අදහස් වන්නේ මරන දඬුවම පැනවීමේ ද බලය සහිත යුද්ධාධිකරනයකින් ඔහුට විරුද්ධව රහසිගත නඩු විභාගයක් කෙරෙනු ඇති බව යි. මෙම අත් අඩංගුවට ගැනීමත් සමග, රාජපක්ෂ තන්ත්‍රය සිය දේශපාලන අරමුනු මුදුන් පමුනුවා ගැනීම සඳහා මිලිටරිය යොදා ගැනීම පුලුල් කර තිබේ. නිලධාරියෙකු ලෙස සේවය කරමින් සිටිය දී දේශපාලන කටයුතුවල යෙදීම සම්බන්ධයෙන් ෆොන්සේකාට චෝදනා කෙරෙන නමුදු, 2006 මැද භාගයේ බෙදුම්වාදී එල්ටීටීඊ සංවිධානයට එරෙහි යුද්ධය යලි ආරම්භ කල තැන්

පටන් ජනාධිපති රාජපක්ෂ මිලිටරිය වඩ වඩාත් දේශපාලනීකරනය කර තිබේ.

ෆොන්සේකාට එරෙහි නිශ්චිත චෝදනා කවරේ දැයි ප්‍රසිද්ධියට පත් කර නැති නමුත්, ආරක්ෂක ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල මාධ්‍ය වෙත මෙසේ පැවසී යඃ''හමුදාපතිවරයා ලෙසත් ආරක්ෂක මාන්ඩලික ප්‍රධානියා ලෙසත් ආරක්ෂක මන්ඩලයේ සාමාජිකයෙකු ලෙසත් කටයුතු කරද්දී ඔහු, විරුද්ධ දේශපාලන පක්ෂ සමග ඍජු සම්බන්ධතා පවත්වා ඇත. මිලිටරි නීතිය යටතේ එය කුමන්ත්‍රනයක් ලෙස සැලකිය හැකි යි. මිලිටරිය තුල සිටිය දී ඔහු ආන්ඩුව පෙරලා දැමීමේ අදහස ඇතිව ජනාධිපතිවරයාට එරෙහිව කුමන්ත්‍රනය කර තිබෙනවා...."

"ආන්ඩුව පෙරලා දැමීමට කුමන්ත්‍රනය කිරීම" සම්බන්ධයෙන් මේ වන තෙක් පවතින එක ම සාක්ෂ්‍යය නම් ෆොන්සේකා ජනාධිපතිවරනයේ දී අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වීම යි. වෙනත් වචනවලින් කිව හොත්, මැතිවරනයක දී ආන්ඩුවට අභියෝග කිරීම කුමන්ත්‍රන ප්‍රයත්නයකට සම කර දක්වනු ලැබේ. ආන්ඩුව මේ ආකාරයෙන් චෝදනා ගෙන ඒමට උත්සාහ කරන්නේ නම්, මෙම අත් අඩංගුවට ගැනීම දේශපාලන විරුද්ධත්වය නීති විරෝධී කිරීමට ද පාර්ලිමේන්තු පාලනයට යටි වල කැපීමට ද ගන්නා ලද බලගතු පියවරක් බවට පත්වේ. පසු ගිය සිව් වසර පුරා රාජපක්ෂ සිය පාලනය ගෙන ගියේ වඩ වඩාත් ජනාධිපති කල්ලියක් වෙත නැඹුරුවීම තුලිනි. එහිදී ඔහු ව්‍යවස්ථාපිත හා නීතිමය ප්‍රතිමානයන් ගර්හාවට ලක් කලේ ය.

හමුදා සේවයෙහි සිටිය දී කල කටයුතු මත ෆොන්සේකාට චෝදනා කර ඇති තත්වය හමුවේ මතුවන ප්‍රශ්නය නම්, ආන්ඩුව ඔහුට එරෙහිව ක්‍රියා කිරීමට මාස ගනනක් ප්‍රමාද වූයේ ඇයි ද යන්නයි. විරුද්ධ පක්ෂ නායකයන් සමග ෆොන්සේකා පැවැත්වූ රැස්වීම් පිලිබඳ තොරතුරු ප්‍රසිද්ධියට පත්ව තිබුනේ ජනාධිපති අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වීම සඳහා ඔහු සිය තනතුරින් ඉල්ලා අස් වන්නටත් කලිනි. එලඹිය හැකි වන එක ම නිගමනය නම් මෙම චෝදනා, ෆොන්සේකා දේශපාලන කරලියෙන් ඉවත් කිරීම සඳහාත්, මහජන පරීක්ෂාවට ලක් නො වී නඩු විභාගයක් සිදු කිරීම සඳහාත්, විරුද්ධ පක්ෂ බිය ගැන්වීම සඳහාත් උචිත ව්‍යාජ හේතු බව යි.

අත් අඩංගුවට ගැනීම සඳහා පෙලඹවූ ආසන්න හේතුව වී ඇත්තේ, පසු ගිය මැයි මාසයේ දී එල්ටීටීඊයේ පරාජයෙන් අවසන් වුනු යුද්ධය අතරතුර දී සිදු කරන ලද යුද අපරාධ සම්බන්ධයෙන් සාක්ෂ්‍ය දෙන බවට තර්ජනය කරමින් අත් අඩංගුවට ගැනීමට පැය කිහිපයකට පෙර ෆොන්සේකා පල කල අදහස් බව පෙනී යයි. ෆොන්සේකා සිය කාර්යාලයේ දී වාර්තාකරුවන් හමුවේ මෙසේ පැවසී යඃ "[යුද අපරාධ ගැන] මම දන්න දේවල්, මට කියපු දේවල් සහ මට ඇහුනු දේවල් මම ඒකාන්ත වශයෙන් ම හෙලි කරනවා. යුද අපරාධ කරපු කවුරු වුනත් අධිකරනය හමුවට ගෙන ආ යුතු යි.... සත්‍යය එලිදරව් කරන අය ද්‍රෝහීන් නොවේ"

මැතිවරන උද්ඝෝෂනය අතරතුර දී, යුද අපරාධවලට සම්බන්ධ බවට රාජපක්ෂ සහ ෆොන්සේකා එකිනෙකාට එරෙහිව චෝදනා එල්ල කර ගත්හ. පසු ගිය මැයි මාසයේ දී ඉහල පෙලේ එල්ටීටීඊ නායකයන් යටත් වන බව නිවේදනය කිරීමෙන් පසුව එය පිලිගන්නවා වෙනුවට ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ජනාධිපතිගේ සොහොයුරු ගෝඨාභය රාජපක්ෂ, ඔවුන් ඝාතනය කිරීමට මිලිටරියට අන කලේ යැයි ෆොන්සේකා මාධ්‍ය වෙත පැවසී ය. පසුව ඔහු තමන් එසේ ප්‍රකාශ නොකල බව කියා සිටියේය. ආරක්ෂක ලේකම්, රාජ්‍ය රහස් හෙලි කිරීම පිලිබඳව ෆොන්සේකාට චෝදනා කල අතර, ආන්ඩුවට පක්ෂපාතී මාධ්‍ය ඔහු "ද්‍රෝහියෙකු" ලෙස හංවඩු ගැසී ය.

සැබවින් ම නම්, සිදු කරන ලද කුරිරු අපරාධ සම්බන්ධයෙන් දෙදෙනා ම වගකිව යුතු ය. එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුව, ඒවන විටත් එල්ටීටීඊ පාලනයට යටත්ව තිබූ හුදෙකලා ප්‍රදේශවලට මිලිටරිය ඉවක් බවක් නැතිව එල්ල කල බෝම්බ සහ ෂෙල් වෙඩි ප්‍රහාරවලින් 2009 ජනවාරි සහ මැයි මාස අතරතුර දී සිවිල් වැසියන් 7,000කට ආසන්න සංඛ්‍යාවක් මියගොස් තිබේ. එමෙන් ම, මිලිටරියේ සහාය ලැබූ ආන්ඩු ගැති ඝාතක කල්ලි විසින්, මාධ්‍යවේදීන් සහ දේශපාලනඥයන් ඇතුලු සිය ගනනක් ජනතාව ඝාතනය කලේ ය. එල්ටීටීඊයේ පරාජයෙන් පසුව දෙමල පිරිමින්, ගැහැනුන් සහ ලමුන් 280,000කට වැඩි සංඛ්‍යාවක් ආයුධ සන්නද්ධ හමුදා භටයන් විසින් ර කවල් ලා සිටි රැඳවුම් කඳවුරු තුල කුරිරු ලෙස ගාල් කර තැබීමට ආන්ඩුව පියවර ගත්තේ ය.

එක්සත් ජනපදය සහ යුරෝපා බලවතුන් විසින් පසු ගිය මැයි මාසයේදී ස්වාධීන පරීක්ෂනයක් අරඹන ලෙස එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමෙන් ඉල්ලා සිටීමෙන් පසුව, මෙරටදී සිදුකල යුද අපරාධ, කථාබහට ලක්වන කාරනාවක් බවට පත් විය. චීනය, ඉන්දියාව හා වෙනත් මිතුරු රටවල සහාය ඇතිව ආන්ඩුවට එම යෝජනාව පරාජයට පත් කල හැකිවූ නමුත්, එම ඉල්ලීම යලි මතුවීමේ හැකියාව ගැන ජනාධිපති රාජපක්ෂ ඇතුලු ඉහල පෙලේ නිලධරයේ අවධානය යොමුව තිබේ. රාජපක්ෂගේ සාපරාධී යුද්ධයට සහාය දුන් එක්සත් ජනපදයට සහ යුරෝපා සංගමයට නම් මෙම සිදුවීම, සිය සතුරන් විශේෂයෙන් ම චීනය, පසෙකට තල්ලු කර දැමීම සඳහා දරන ප්‍රයත්නයේ දී කොලඹ ආන්ඩුවට පීඩනය යෙදීම සඳහා යොදා ගත හැකි සංවේදී මාධ්‍යයක් බවට පත්ව තිබේ.

ආන්ඩුව මිලිටරි චෝදනා එල්ල කිරීම තුලින් ෆොන්සේකාට එරෙහිව පියවර ගැනීමට සූදානම් වෙමින් සිටින බව ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ පසු ගිය සතියේ ඉඟි කලේ ය. ඔහු බීබීසී මාධ්‍ය වෙත මෙසේ පැවසී යඃ "ඔහු [ෆොන්සේකා] නිශ්චිත වැරදි කීපයක් කර තිබෙනවා. ඔහු ආරක්ෂක මන්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් සිටියදීම ආරක්ෂක තොරතුරු හෙලි කරලා තියෙනවා. ඔහු [යුද්ධය අතරතුර දී] වැරදි අන දීම් කලා යැයි මට චෝදනා කලා." තමන් කිසිදු ආකාරයක යුද අපරාධ පරීක්ෂනයකට ඉඩ නොදෙන බව සම්මුඛ සාකච්ඡාව අතරතුර දී ආරක්ෂක ලේකම් අවධාරනය කලේ ය.

ජාත්‍යන්තර යුද අපරාධ පරීක්ෂනයක දී සාක්ෂි දෙන බවට ෆොන්සේකා දී ඇති ප්‍රතිඥාව වූ කලී ආන්ඩුවට පීඩනය යෙදීම සඳහා තමන් ව ආයුධයක් කර ගත හැකි බව එක්සත් ජනපදයට හා යුරෝපා සංගමයට විවෘතව දන්වා සිටීමක් බඳුය. මැතිවරන ව්‍යාපාරය අතරතුර දී, "ජාත්‍යන්තර ප්‍රජාව" සතුරු කර ගැනීම හා මෙරට අපනයන සඳහා දෙන ජීඑස්පී සහනය නිමා කරන බවට යුරෝපා සංගමය ගත් තීරනයේ ප්‍රතිපල වශයෙන් රටේ ව්‍යාපාරයන්ට අවාසිදායක තත්වයක් උදාකිරීම පිලිබඳව ජනරාල්වරයා රාජපක්ෂ පාලනය විවේචනය කලේ ය.

මේවන තෙක් එක්සත් ජනපදය හා යුරෝපීය බලවතුන් අවඥා සහගත ලෙසින් ෆොන්සේකා පසෙකට දමා ඇති බවක් පෙනී යයි. මැතිවරන ප්‍රතිපලය, මැතිවරන දූෂන හා ඉන්පසුව විරුද්ධ පක්ෂ වෙත කඩාපැනීම් පිලිබඳව එක්සත් ජනපදය දක්වා ඇත්තේ නිහඬ ප්‍රතිචාරයකි. පෙර දිනයේ ෆොන්සේකා අත්අඩංගුවට ගැනීමෙන් පසුව, එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රකාශකයාට පලකල හැකිවූයේ ''ගනු ලබන කුමන පියවරක් හෝ ශ්‍රී ලංකාවේ නීතියට අනුකූල විය යුතුය යන්න ගැන අවධානයෙන් සිටින්නේය'' යන්නය. සම්ප්‍රධායික රාජ්‍ය තාන්ත්‍රික අව තක්සේරුවක් ලෙස සැලකිය හැකි ඔහුගේ ප්‍රකාශයෙන් සඳහන් කෙරුනේ, අත්අඩංගුවට ගැනීම වූ කලී ''මැතිවරනයක් අවසන්වූ වහාම සිදුවූ අසාමාන්‍ය ක්‍රියාවක්'' ය යන්නය.

මෙම ප්‍රකාශයන්, ශ්‍රී ලංකාවේ ඊනියා මානව අයිතීන් පිලිබඳ ප්‍රශ්න යටපත් කිරීමේ ඔබාමා පාලනාධිකාරයේ අවශ්‍යතාවන්ට අනුකූලය. පසුගිය දෙසැම්බරයේ ඉදිරිපත් කල විදේශ සම්බන්ධතා පිලිබඳ එක්සත් ජනපද සෙනේට් සභා වාර්තාවකින් නිර්දේශ කල ආකාරයට, කොලඹ ආන්ඩුව මත වැඩිවන චීන ආර්ථික හා දේශපාලන බලපෑම් වලට හරස් කැපිය හැකි පරිදි ''කෙටිකාලීන මානව අයිතීන් පිලබඳ පූර්න අවධානය යෙදීමට වඩා ශ්‍රී ලංකාව පිලිබඳ පුලුල් හා වඩාත් දැඩි ප්‍රවේශයක්'' අවශ්‍ය කෙරෙයි. දිවයින තුල එක්සත් ජනපදයේ ආසක්තයන් පෙරට ගැනීමේදී ෆොන්සේකා ඉත්තෙකු ලෙස යොදාගත හැකි යයි වොෂින්ටනයට හැඟී යන්නේ නම්, එවන් ප්‍රවිශ්ඨයක් පහසුවෙන්ම ඉවත දැමෙනු ඇත. කොලඹ මාධ්‍ය කරගත් පාලක පන්තියේ කලි කලහය උත්සන්න කෙරෙන ප්‍රමුඛ සාධකයක් වන්නේ ප්‍රධාන බලවතුන් අතර පවත්නා එදිරිවාදිකම් තුල මෙරට පැටලී සිටීමයි.

අවසාන විග්‍රහයේදී ආන්ඩුවේ කඩා පැනීම් මූලිකව ෆොන්සේකා හා විරුද්ධ පක්ෂ වෙත යොමුවී නොමැති අතර එය, ආන්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සීමාවන් පිලිබඳ නිර්දේශ ක්‍රියාවට නගනවාත් සමගම කම්කරු පන්තිය වෙතින් මතුවියහැකි විරෝධයට මුහුනපෑම සඳහා කෙරෙන පෙරහුරුවක් වනු ඇත. මෑතක් වන තෙක්ම ආන්ඩුවේ විශ්වාසනීය සගයෙකුව සිටි ෆොන්සේකා අත්අඩංගුවට ගැනීම, සිය ජීවන තත්වයන් ආරක්ෂාකර ගැනීමට වෙර දරන වැඩකරන ජනතාව වෙතින් එල්ලවෙන විරෝධයට එරෙහිව යොදාගනු ඇති මර්ධනය පිලිබඳ තියුනු අනතුරු ඇඟවීමකි.

© www.wsws.org